# සිය බස් ලකර හා පැරණි සිංහල කවි සමය—1

## කාව්‍ය ලක්‍ෂණ හා වස්තුව

කාව්‍ය ශාස්ත්‍රයෙහි සැම කල්හි ම මූලික ප්‍රශ්නයක් ව පවත්නා වූ "කාව්‍යය යනු කුමක්ද? යන්න විසඳීමට ප්‍රථමයෙන් කාව්‍ය වස්තුව පිළිබඳ අවබෝධයක් ඇතිකර ගැනීම යෙහෙකැ යි සිතේ. කාව්‍ය වස්තුව කුමක් ද යන ප්‍රශ්නය විභාග කිරීම යට කී කාරණය තේරුම් ගැනීමට ඉවහල් වනු ඇත. කාව්‍යයේ අභ්‍යන්තර ස්වභාවය පිළිබඳ යථාවබෝධයක් ඇති කර ගැනීමට මුල් පියවරක් වශයෙන් එහි ස්වරූපය තේරුම් ගැනීම වටී. එවිට කාව්‍යයකින් අවශ්‍යයෙන් බලාපොරොත්තුවනු ලබන්නාවූ රස, ධ්වනි ආදී සූක්ෂ්ම ධර්මයන් වටහා ගැනීමට ද පහසු වෙයි. එහෙයින් පළමු කොට කාව්‍ය වස්තුව පිළිබඳ පරීක්ෂණයක් කිරීම යෝග්‍ය වේ.

කාව්‍ය ශාස්ත්‍රයේ ආදි ම අවස්ථාවෙහි දී කාව්‍යයට වස්තු වූ දෙය ශරීරය හා අලංකාර නමින් හඳුන්වන ලදි. භරත මුනිහුගේ නාට්‍ය ශාස්ත්‍රයෙහි කාව්‍ය ශරීරය පිළිබඳ සඳහනක් නොවතත් අලංකාර ගැන සඳහන් වෙයි. එම ග්‍රන්ථයේ සොළොස්වන අධ්‍යායයෙහි කාව්‍ය ශාස්ත්‍රය කොටස් සතරකට බෙදනු ලැබේ. ඒ නම් (1) චතුර්විධ අලංකාරය, (2) දශවිධ ගුණය, (3) දශවිධ දෝෂය, (4) සතිස් ලක්ෂණ යනු වෙයි. ශාස්ත්‍රයෙහි ප්‍රධාන කොටස් මෙසේ වී ය යි සැලැකිය හැකි ය. භරත මුනිහුගේ ග්‍රන්ථයෙහි දක්වෙන පරිදි කාව්‍ය ශාස්ත්‍රය නාට්‍ය ශාස්ත්‍රයට යටත් වූ ද එහි එක් අංගයක් වූ ද ශාස්ත්‍ර ප්‍රභේදයක් වූ බව සැලැකිය යුතු යි ඒ හැම අංගයක් ම නාට්‍යයෙහි පරමාර්ථය වූ රස පෝෂණය පිණිස යෙදේ.

භාමහගේ කාව්‍යාලංකාරය නම් ග්‍රන්ථයෙන් පෙනී යන්නේ කාව්‍ය විෂයයෙහි අලංකාර ශාස්ත්‍රය ප්‍රමුඛ ස්ථානය දැරූ බව යි. අලංකාර ශාස්ත්‍රය ප්‍රධාන වන අතර නාට්‍ය ශාස්ත්‍රය හා රස වාදය ද්විතීය ස්ථානයට එළඹෙයි. ස්වකීය ග්‍රන්ථයට කාව්‍යාලංකාරය යි නම් තැබීමෙන් අලංකාරය කාව්‍යයේ ප්‍රධාන අංගය ලෙස ඔහු සැලැකුවා පමණක් නොව නාට්‍ය ශාස්ත්‍රයට යටත් නොවූ කාව්‍ය විචාර මාර්ගයක් ද භාමහ විසින් ආරම්භ කරන ලද බව ද ඔප්පු වේ.

ආදි යුගයෙහි විසූ ආලංකාරිකයෝ කාව්‍යයේ ස්වභාවය, කාව්‍ය රසය, කාව්‍ය රසාස්වාදනය නොහොත් කාව්‍යයේ රස විඳීම යන කරුණු විශේෂයෙන් නො සැලැකූ හ. ඒ වනාහි පසු කලෙක විසූ විචාරකයන් සතු වූ කාර්‍ය්‍යයකි. භාමහ[1] සහ දණ්ඩී[2] කාව්‍ය ශරීරය ගැන ම වෙහෙසුණ හ. එහෙත් කාව්‍යයේ ස්වභාවය අල්ප මාත්‍රයෙන් වුව ද වටහා ගත් බව සිතීමට තුඩු දෙන සාධක නැත්තේ නො වෙයි. කාව්‍යය ශරීරයක් ලෙස සැලැකූ ඔවුහු කාව්‍යාත්මයක් ගැන හැඟෙවුවා විනා එය ඉඳුරා ප්‍රකාශ නො කළහ.

කාව්‍යයක ශබ්දයත් අර්ථයත් අලංකාරයත් භාමහ සැලැකුවේ ය. සුන්දර වූ අර්ථයක් ගැප් වූ ද, විචිත්‍ර වූ අලංකාරයන් ගෙන් සරසන ලද්ද වූ ද, උචිත වූ පද සමූහයකින් නොහොත් ශබ්දයන් ගෙන් යුක්ත වූ වාක්‍ය ප්‍රයෝගය කාව්‍යයේ අග්‍ර ඵලය ලෙස හෙතෙම සැලැකුවේ ය.

කාව්‍ය ශරීරය ප්‍රධාන කොටස් දෙකකින් යුක්ත වෙයි. එක් අතකින් ශබ්ද–අර්ථ දෙක හා අනෙක් අතින් අලංකාරයෝ ද වෙති. භාමහ ගේ මතය පරිදි ශබ්දයත් අර්ථයත්

1. *Kāvyālankāra*—Text with English Translation and notes. Edited by Sastri (Tanjore, 1927) I. 23.
2. කාව්‍යාදර්ශය—දෙඩන්දූවේ ධර්මසෙන සංස්කරණය (කොළඹ, 1905). I. 10





නිසි ලෙස ගැලපීම කාව්‍යය නම් වෙයි. එහෙයිනි 'ශබ්දාර්ථෞ සහිතෞ කාව්‍යම්'[3] කියන ලද්දේ. මෙයින් පෙනෙන්නේ ඔහු අලංකාරය කාව්‍යයෙහි අංගයක් ලෙස සැලැකුව ද එය අත්‍යවශ්‍ය අංගය ලෙස නො තැකූ බව යි. කාව්‍යයෙහි අග්‍ර ඵලය ලැබීමට ඉවහල් වන කරුණු අතර අලංකාරය ද ගැණෙතත් කාව්‍යයට අවශ්‍යයෙන් ම තිබිය යුත්තේ ශබ්දය හා අර්ථය යන දෙක පමණි. කවියකුගේ නිර්මාණ ශක්තියෙන් හා බුද්ධියෙන් (ඒ නම් ප්‍රතිභායෙන්) පැන නඟින්නාවූ කාව්‍ය රසය කාව්‍යයෙහි අවශ්‍ය අංගයක් වන බව නො කියැවෙයි. කාව්‍යයක ප්‍රාණවත් පක්ෂය හෝ රසවත් පක්ෂය හෝ ඔහුගේ විමැසිල්ලට භාජන නො වෙයි. අලංකාරයන් ගෙන් යුක්ත වූ කාව්‍යයේ බාහිර ස්වරූපය නොහොත් ආකෘතිය ම ය ඔහුගේ විශේෂ සැලැකිල්ලට යොමු වනුයේ.

කාව්‍ය වස්තුව පිළිබඳ දණ්ඩී ගේ මතය භාමහ ගේ මතයට බෙහෙවින් සමාන ය. දෙදෙනා ම කාව්‍යයේ ශරීරයත් අලංකාරත් විස්තර කරති. දණ්ඩී තම කෘතිය වන කාව්‍යාදර්ශයෙන් කොතරම් විශාල කොටසක් අලංකාරයන් විස්තර කිරීමට වෙන් කොට ඇත ද කාව්‍යයේ ප්‍රාණය වශයෙන් සලකන්නේ ගුණය යි.

කාව්‍යාදර්ශයේ I: 10 වැනි ශ්ලෝකයෙහි ශරීරය හා අලංකාර පිළිබඳ සඳහන් වෙයි:

> තෛඃ ශරීරං ච කාව්‍යානාම--ලංකාරාංශ්ච දර්ශිතාඃ,
> ශරීරං තාවදිෂ්ටාර්ථව්‍යවච්ඡින්නා පදවලී.

"ඒ පූර්වසූරීන් විසින් කාව්‍යයන්ගේ ශරීරය ද අලංකාරයෝ ද දක්වන ලදහ ; ශරීරය නම් ඉෂ්ටාර්ථයෙන් නුසුන් වූ පද සමූහය යි." මෙහි ශරීරය හඳුන්වා ඇත්තේ ඉෂ්ටාර්ථයෙන් නුසුන් වූ පද සමූහය හැටියට යි. ඉෂ්ටාර්ථ යන්නෙන් අදහස් කරනු ලබන්නේ කුමක් ද ? රසවත් වූ ද වර්ණනා කිරීමට සුදුසු වූද කවින්ගේ ප්‍රතිභාවට විෂය වූ ද සුන්දර පදාර්ථයෝ ය. ඒ වැනි ඉෂ්ටාර්ථයන්ගෙන් ව්‍යවච්ඡින්න වූ නොහොත් විශේෂයෙන් අවිච්ඡින්න වූ, පරිපූර්ණ වූ පද සමූහය යි. "ඉෂ්ටත්වය නම් සාහිත්‍ය ශාස්ත්‍රයෙහි චමත්කාරය පෙරටු කොට වර්ණනා කිරීමේ අභිලාෂය යි. චමත්කාරය ලෝකෝත්තර ප්‍රීතියක්" වන බව ද කියැවෙයි. ඉෂ්ටත්වං ච සාහිත්‍ය ශාස්ත්රේ චමත්කාර පූර්වක වර්ණනාභිලාෂඃ. චමත්කාරශ්ච ලෝකෝත්තරාහ්ලාදඃ[4] යනු ව්‍යාඛ්‍යාන පාඨය යි. මෙයින් කාව්‍ය ශරීරය පද සමූහයක් වන බව පැහැදිලි යි. එහෙත් ඒ පද සමූහය ඉෂ්ට වූ අර්ථයන්ගෙන් නුසුන් විය යුතු යි.

කාව්‍ය ශරීරය සැරසිය යුත්තේ ය. එය හොබවන ලද්දේ, අලංකාර කරන ලද්දේ අලංකාරයන් ගෙනි. එහෙයින් කාව්‍යාදර්ශයෙහි[5] ම

> "කාව්‍යශෝභාකරාන් ධර්මාන–ලංකාරාන් ප්‍රචක්ෂතේ
> තේ චාද්‍යාපි විකල්ප්‍යන්තෙ–කස්තාන් කාර්ත්ස්න්‍යේන වක්ෂ්‍යති."

"කාව්‍යය හොබවන ධර්මයන් අලංකාරයනැ යි කියති. ඒ අලංකාරයෝ අද දක්වාත් විවිධාකාරයෙන් දක්වනු ලැබෙත්. කවරෙක් ඔවුන් සාකල්‍යයෙන් කියන්නේ ද ?" යනුයෙන් අලංකාරයන් විවිධාකාර වූ බව කාව්‍යාදර්ශ කතුවරයා සඳහන් කරයි. යම් සේ විවිධ වූ ආභරණයෝ ශරීරයක් සරසත් ද ඒ සේ ම විවිධ වූ අලංකාරයෝ කාව්‍ය ශරීරය ද සරසත්.

3. *Kāvyālankāra*—Edition Sastri, I, 16
   De S. K.—*Studies in the History of Sanskrit Poetics.* (London, 1925) II, 46—47, පිටු ද බලන්න.
4. *Kāvyādarśa of Dandin*—Edited with an original commentary by Vidyābhūṣaṇa Pandit Rangacharya Raddhi Sastri. (Poona, 1938): 8.
5. II. 1.

වාමන ගත් මහ දණ්ඩී ගේ මතට බෙහෙවින් සමාන වේ. දණ්ඩී මෙන් ඔහු ද කාව්‍යයේ ශරීරය වාක්‍යය යි පිළිගත් සේ පෙනේ. රීතිය කාව්‍යයෙහි ආත්මය වන බව ප්‍රකාශ කරන අතර වාමන කාව්‍ය ශරීරය ද හඳුන්වයි :... "රීතිය නම් කාව්‍යයේ ආත්මය යි, එහි ශරීරය වාක්‍යය යි."

"රීතිර් නාමේයමාත්මා කාව්‍යස්‍ය ශරීරස්‍ය චේති වාක්‍යශේෂඃ[6]"

යනු කාව්‍යාලංකාරසූත්‍ර වෘත්තියෙහි දක්වෙන පාඨයකි.

යථෝක්ත විස්තරයෙහි කාව්‍ය විචාරකයන් තිදෙනකුගේ මත හඳුන්වන ලදි. කාව්‍යයේ ප්‍රධාන අංගය හෝ ප්‍රාණය හෝ ආත්මය හෝ පිළිබඳ ඔවුන්ගේ මත වෙනස් වුවත් කාව්‍ය ශරීරය පිළිබඳ ඔවුන් පැවැසූ අදහස් බෙහෙවින් සමාන වූ බව ඉඳුරා පැහැදිලි වෙයි. ඔවුන්ගේ දෘෂ්ටි කෝණය එකිනෙකට වෙනස් වී ය. ඔවුන් අදහස් ප්‍රකාශ කළ අයුරු ද වෙනස් වෙයි. කාව්‍ය වස්තුවට අත්‍යාවශ්‍යක වූ අංගය ශබ්දාර්ථ දෙකින් යුක්ත වූ වාක්‍යය බව තිදෙනා ම පිළිගත් සේ පෙනේ. එය වනාහි ශබ්ද අර්ථ දෙක නිසි පරිදි ගැලපීම යි භාමහ කිය. එය ඉෂ්ටාර්ථයෙන් අනූන වූ, (නො අඩු වූ) පද සමූහය යි දණ්ඩී පැවැසී ය. ඒ දෙකට ම නොවෙනස් වන පරිදි කාව්‍යයේ ශරීරය වාක්‍යය යි වාමන කී ය.

*　　　*　　　*

සිය බස් ලකර නම් වූ ප්‍රශස්ත අලංකාර ග්‍රන්ථය දණ්ඩ්‍යාචාර්‍ය්‍යයන්ගේ කාව්‍යාදර්ශයේ සිංහල අනුවාදයකි. මූලාශ්‍රය වූ කාව්‍යාදර්ශයට අසමාන තැන් කිහිපයක් ම මෙම ග්‍රන්ථයෙහි ඇති බැවින් එය සම්පූර්ණයෙන් පරිවර්තනයකැ යි කිව නො හැකි යි. කාව්‍ය ලක්ෂණ, අලංකාර, ගුණ, දෝෂ ආදී කාව්‍යයෙහි විවිධ අංග විස්තර කරන මේ ග්‍රන්ථ කර්තෘවරයා කාව්‍යය ශබ්දයන් ගෙන් යුක්ත වූ ශරීරයක් ලෙස සලකයි. එය ශබ්ද-අර්ථ දෙදෙනා ගේ මනා ගැලපීම යි. යම් සේ විවිධ ආභරණවලින් ශරීරය හොබවනු ලැබේ ද එසේ ම විවිධ අලංකාරවලින් කාව්‍යය ද හොබවනු ලැබේ. කාව්‍යය අලංකාරවලින් හෙබවිය යුතු ශරීරයකි. කාව්‍යාදර්ශය මෙන් ම සිය බස් ලකර ද තුන් සඟකින් යුක්ත යි. මුල් ග්‍රන්ථයෙන් සිය බස් ලකර කතුවරයා ගෙන හැර දක්වන්නේ සිංහලයට අදාළ වන කොටස් පමණ යි. මුල් ග්‍රන්ථය ශ්ලෝක 650 කින් යුක්ත වන අතර මෙම ග්‍රන්ථයෙහි ඇත්තේ ගී 400 කි. 1 වන සඟෙහි මහා කාව්‍ය ලක්ෂණ, වර්ණනා ක්‍රම, දශවිධ ගුණයන්ගෙන් සත් ගුණයක්, කවිත්ව හේතු, කවිත්ව ලාභෝපාය ආදී කරුණු දක්වනු ලැබේ. 2 වන සඟෙහි 35 අලංකාරයෝ දක්වනු ලැබෙත්. ඒ මෙ සේ යි :— (1) ස්වභාවෝක්ති, (2) උපමා, (3) රූපක, (4) දීපක, (5) ආවෘත්ති, (6) ආක්ෂේප, (7) අර්ථාන්තරන්‍යාස (8) ව්‍යතිරේක, (9) විභාවනා, )10) සමාසෝක්ති, (11) අතිශයෝක්ති, (12) උත්ප්‍රේක්ෂා, (13) හේතු, (14) සූක්ෂ්ම, (15) ලේශ, (16) ක්‍රම, (17) ප්‍රේයස්, (18) රස, (19) ඌර්ජස්ව, (20) පර්‍ය්‍යායෝක්ති, (21) සමාහිත, (22) උදාත්ත, (23) අපහ්නුති, (24) ශ්ලේෂ, (25) විශේෂ, (26) තුල්‍යයෝග, (27) විරෝධ, (28) අප්‍රස්තුතස්තෝත්‍ර, (29) ව්‍යාජස්තුති, (30) නිදර්ශන, (31) සහෝක්ති, (32) පරිවෘත්ති, (33) ආශීර්වාද, (34) සංකීර්ණ, (35) භාවික ආදී වශයෙනි. 3 වන සඟෙහි යමකාදි කොට ඇති බන්ධන සහ දශවිධ කාව්‍ය දෝෂ දක්වා ඇත.

මෙම ග්‍රන්ථය ක්‍රි.ව. 846 ටත් 972 ටත් අතර කාලයෙහි ලකදිව රජකමට පත් සලමෙවන් සෙන් නම් රජ කෙනෙකු විසින් රචනා කරන ලදි. ඒ රජතුමා ගේ සහෝදර වූ අමරගිරි කාශ්‍යප නම් මහ ඈපාණන් විසින් මෙය රචනා කරනු සඳහා ආරාධනය කරන ලද බව මෙහි ආ ග්‍රන්ථාවසාන ගියකින් පෙනේ.

කවි සමය නම් කවීන් ගේ සම්ප්‍රදායය යි. කාව්‍ය ශාස්ත්‍ර විෂයයෙහි භාවිත වන ශිෂ්ට සම්පන්න ජනයාට අභිමත වූ ශිෂ්ට ප්‍රයෝග නියමය යි.

---

6. *Kāvyālankāra Sūttras* (with gloss)—Edited by R. G. Bhaṭṭa. Benares Sanskrit Series (Benares 1908). 1. 2. 6.





කාව්‍යය පිළිබඳ පැරැණි සිංහල විචාරකයන් ගේ මතයක් වී ද ? මෙයට පිළිතුරු සැපැයීම වස් අපට පිහිට වනුයේ සිය බස් ලකර යි. කාව්‍යය පිළිබඳ සිය බස් ලකර කතුවරයා ගේ මත බෙහෙවින් ම කාව්‍යාදර්ශ කර්තෘවරයා ගේ මතවලට අනුකූල වූ බව නොරහසකි. එහෙත් සිය බස් ලකර කතු තුමා ස්වකීය ආචාර්ය වරයා තරම් ප්‍රතිපාක්ෂිකයන් ගේ මතවලට පටහැනි ව ලියූ බවක් නො පෙනේ. කාව්‍යාදර්ශයේ කර්තෘ වූ දණ්ඩ්‍යාචාර්යතුමා භාමහ ගේ අදහස්වලට තදින් පහර දෙන්නට සැරසුණු බව පෙනේ. අවසරලත් හැම තන්හි දී ම එසේ කිරීමට එ තුමා පසු නො බැසී. සිය බස් ලකර කතුවරයා පිළිබඳ ව එ බන්දක් කිව නො හැකි ය. ග්‍රන්ථයේ මුල් ගී නවයෙන්[7] කාව්‍යය සම්බන්ධයෙන් ස්වකීය අදහස් සාමාන්‍ය වශයෙන් ගත් කතුවරයා ගෙන හැර දක්වයි. කාව්‍යාදර්ශය හැර අලංකාර ශාස්ත්‍රය පිළිබඳ තවත් බොහෝ ග්‍රන්ථ තමා හැදෑරූ බව ස්වකීය ග්‍රන්ථයෙන් හෙළි වෙයි. දඬි ඇදුරා හැර යටත් පිරිසෙයින් තවත් ආලංකාරිකයන් දෙදෙනෙකු ගේ නම් එ තුමා සඳහන් කරයි. ඒ වග දෙ වැනි ගියෙන් ඔප්පු කළ හැක:

"මහ බඹ සකාසුරු—ඇජරා එකසුබු ඉසි
පවර වාමන දඬි ඈ—නැමද කව්ලකුණුජරන්."[8]

කසුබු ඉසිවරයා (කාශ්‍යප) හා වාමන පඬිතුමා ගැන යට දක් වූ පාඨයෙන් සඳහන් වේ. මෙහි සඳහන් කරනු ලබන මහ බඹ (මහා බ්‍රහ්මයා), සක් (ශක්‍රයා), සුර ඇජරා (බෘහස්පති) ආදීන් කල්පිත චරිතයන් විය හැකි වුවත් කසුබු ඉසි හා වාමන පඬිවරයා සම්බන්ධයෙන් සැක කිරීම නුවුව මනා යි. සකුයෙන් ලියැවුණු පත පොත තමා විසින් භාවිතා කරනු ලැබුව ද තමා පවසන්නේ සිය බසින් (සිංහලයෙන්) කරන ලද කාව්‍යයන් ගේ ලක්ෂණ බව කතුවරයා මුලින් ම පහද දෙයි. එ ද ස්වභාෂාමය කාව්‍ය ලක්ෂණයෙන් එක් දේශයක් වන බව ඉඳුරා පළ කෙරෙ යි.

"දෙ රුස් වස් කියම්—පෙර නත් සකෙව්නිදු වූ
නොදත නොදත දෙව් බස්—සිය කව් ලකුණු නෙක් දෙස්."[9]

වචනයට නොහොත් ශබ්දයට තමා ඉමහත් සැලැකිල්ලක් දක්වූ බව පෙනේ. සියලු ශබ්දයෝ ප්‍රසාද ගුණය හේතු කොට ගෙන පවත්නාහු වෙති. ලෝක යාත්‍රාව පවත්වන්නෝ ශබ්දයෝ ම ය. ඉදින් ශබ්ද නැමැති ප්‍රදීප රශ්මි සමූහය නොදිලිසුණේ වී නම් මෙ තුන් ලොව ම අන්ධ භාවය දෙන්නාවූ ඝනාන්ධකාරයක් වන්නේ ය.

". . . . . . . .—සියල් වදනුන් ම පහන්
ගුණෙන් පවති සවාරෙන්—නෙමෙ ලෝයා පවත්මින්
මෙ තුන් ලෝ සියල්—ඉදි සද වැටුප් රුස් රුස්
නො දිලි යෙන'ද බැව් ද—තම කඳ නො කල්හායෙන් "[10]

තව ද, පෙර මහ රජුන් ගේ යස නමැති පිළිබිඹුව ගමන් කොට බස නමැති කැටපතෙහි පිහිටියේ නැවැත ඔවුන් නැති කාලයෙහි ද දෘශ්‍යමාන වෙයි. බස මනා කොට පැවැසූ අයට සුරභි ධේනුව මෙන් ඉෂ්ටාර්ථ සිද්ධිය සලසා දෙයි. ක්‍රම වරදවා බස යෙදූ තැනැත්තාට හුදු ගොන් බව ම සාද දෙයි.

"පෙර මහරු මහරජ—යස පිළිබිඹු ගොස් බස්
කැට තලෙහි සිටුණෙ පෙනේ—පිළි ඔවුනා හට කල්හි දූ"

"ගව'හන වේ පසස්—නද බස් කැරැ සකස්
පියසුවහට අන් හට—ගව බැව් ම හුදු සාද."[11]

---

7. සිය බස් ලකර විවරණය—බෙන්තර ධම්මසෙන සංස්කරණය. (කොළඹ, 1948) 1—9 ගී. [සි.බ.ල.]
8. සි.බ.ල. 2.
9. —එම— 3.
10. —එම— 4—5.
11. —එම— 6—7.

බස නොමනා ලෙස යොදන්නවුන්හට ගොන් බව ම සාද දෙනු බව කියමින් ඔවුන් අන්ත පරිහාසයට ලක් කරයි. ගව බැව් යන්නෙහි ශ්ලේෂාර්ථය සලකන කල්හි, කාව්‍යාදර්ශයෙන් ගන්නා ලද ඒ උපමාව කදිම යෙදුමක් බව පෙනේ. කාව්‍යයෙහි මඳ දෙසක් වුව ද සෙවිය යුත්තේ ය ; සුන්දර වූ ශරීරයක් එක් කැලලක් නිසා සියල් සිරියෙන් පිරිහෙන්නා සේ එක් දෙසක් නිසා සුන්දර වූ කාව්‍යයක් කිලිටි විය හැකිය.

> " එ බවිනි කව්හි මඳ—දෙසුදු සොයන්නට වත්
> තැනූ එක් ලපෙක්නි සියල්—සිරිහුන් ව සොඳුරු දූ වූ."[12]

එහෙත් කාව්‍යයෙක ගුණ දෙස් පිරික්සීම කා හටත් කළ නො හැකි වෙයි. එය කළ හැක්කේ මනා කොට ග්‍රන්ථ උගත් පුද්ගලයාට ය. එසේ ශාස්ත්‍ර ග්‍රන්ථ උගත් පුද්ගලයාට ගුණ දෙස් පිරික්සීමේ ශක්තියක් ඇති වන්නේ ය. අන්ධයාට රූප හෙද දර්ශනයෙහි කවර නම් සම්බන්ධයක් ඇද්ද ?

> " ගුණ දෙස් කෙසේ ගත්—නොදන්නා දෙනෙ කෙරෙ තොර
> කිම අඳහට ඇත සබඳ—රූ වෙ දස්නෙහි සියල්." [13]

එහෙයනි පෙර පඬුවන් විසින් සකල ලෝක සන්ඣයා ව්‍යක්ත කරන අධ්‍යාසයෙන් විචිත්‍ර මාර්ග ඇති වචනයනට කාව්‍ය ලක්ෂණ බඳනා ලද්දේ.

කාව්‍ය ශරීරය හඳුන්වන සිය බස් ලකර කතුවරයා ස්වකීය ආචාර්ය තුමා ගත් මඟ ම ගනිමින් කාව්‍ය ශරීරයත් අලංකාරයත් දක්වයි. අභිප්‍රේතාර්ථය ප්‍රකාශ කළාවූ වචන ප්‍රබන්ධය හෙවත් වදන් පබඳ කාව්‍ය ශරීරය වේ :[14] ඒ කාව්‍ය ශරීරය ගද්‍ය පද්‍ය මිශ්‍රාදි වශයෙන් ත්‍රි විධ වේ. ඉන්පසු සංඝාත, කෝෂ, මුක්තක, කුලක, සර්ගබන්ධ යනාදි වශයෙන් පද්‍ය කාව්‍යයේ ප්‍රභෙද දක්වනු ලැබේ. තව ද පියුම්, ගී, දෙ පද බැඳුම්, සතර පද බැඳුම්, අට පද බැඳුම්, දෙළොස් පද බැඳුම්, සොළොස් පද බැඳුම් හා සැහැලි, ඇහැලි, උපහැලි, බැහැලි, අඹහැලි හා පිහියොඹ, සිතිලි ගී, උනුසඳ වසම්සඳ යන බැඳුම් විශේෂ ද දක්වනු ලැබේ. තව ද ගල සඳ (ගලවඡඤස්), සුන්හිස් (ශිරශ්ඡින්න), දෙව් පාණි (දේවපා ණි) නම් වූ බැඳුම් ද සඳහන් කරනු ලැබේ.

මහා කාව්‍ය ලක්ෂණ දක්වන්නට පෙර කතුවරයා පද්‍යය බුද්ධ චරිතය වැනීමට ද, ගද්‍යය ව්‍රත චාරිත්‍ර ආදිය වැනීමට ද ගද්‍ය පද්‍ය දෙක මිශ්‍ර කොට කරන ලද රචනා නාටක නිපදවීමට ද යෙදිය යුතු බව සඳහන් කරයි :

> පෙදෙන් බුදු සිරිතැ—බසින් වත් සිරිත් ඈ
> පද යුතු බසින් නළු ඈ—අනතුරු ලකුණු දක්වම "[15] යන

පාඨයෙන් එය පෙනේ. මහා කාව්‍යයක් උදර කථානායකයකු ගෙන් යුක්ත විය යුතු යි කාව්‍යාදර්ශ කතෘහු සඳහන් කළ සේ මෙම ගත් කතුවරයා පද්‍ය කාව්‍යයකට යොග්‍ය වූ උදර චරිතයක් නම් බුදුන් ගේ චරිතය යි සිතුවා විය හැකි. මෙ රට කවි සමය අනුව කල්පනා කරත හොත් බුදුන් ගේ චරිත කථාවක් කාව්‍යයට ඉතා ම සුදුසු වස්තුවක් ලෙස සැලැකූ බව පෙනේ. කිවි බව කාව්‍ය වෘක්ෂයෙහි කුසුම් සම්පත්තිය වෙති යි කව් සිළු-මිණ කරුවෝ කී හ. එහි විපුල් පලය නම් බෝසත් චරිතය වැනීම යි ඔහු සැලැකූ හ.

> " කිවි බැව් කිවි දුමේ—කුසුම් සැපතෙහි විපුල් පෙලෙ
> බෝසත් සර වැනුම්—වියනෙමුව පවත් වේ වා "[16]

---

12. —එම— 8.
13. —එම— 9.
14. —එම— 11.
15. —එම— 20.
16. කව්සිළුමිණ—මඩුගල්ලේ සිඩාර්ථ සංස්කරණය. (කොළඹ, 1926). 4.





මෙ කී සිද්ධාන්තය අනතුරු කාලයේ විසූ කවීන් ගේ රචනාවල වචනයෙන් ප්‍රකාශ නොවූවත් ඔවුන් එය මහත් ඕනෑ කමින් අනුගමනය කරන ලද බව පෙනේ. ගී පොත් කරුවන් ති දෙන ම තම කාව්‍යයනට වස්තු කොට ගත්තේ බෝසත් චරිත ගැප් වූ ජාතක කථා යි. තොටගමුවේ ශ්‍රී රාහුල හිමියෝ කාව්‍යශේඛරයෙහි ද වැත්තැවේ හිමියෝ ගුත්තිලයෙහි ද එ ම රීතිය අනුගමනය කළ හ. මාතර ලේඛකයන් අතුරින් මහා කාව්‍ය-යන් රචනා කිරීමට තැත් කළ කවිහු ද එ මඟ ම ගත් හ.

කාව්‍ය නායකයා ගුණවත් පුද්ගලයකු ලෙස වර්ණනා කිරීම යෙහෙකැ යි පවසනු ලැබේ. එසේ වර්ණනා කොට අනතුරු ව ඔහු සතුරන් දිනූ සැටි කියත හොත් ඒ වනාහි ස්වභාවයෙන් ම යහපත් මාර්ගය යි.

කාව්‍ය ගුණ දසයක් ඇති බව කියැවෙයි. මටසිලුටු (ශ්ලේෂය), පහන් (ප්‍රසාදය), සම බැව් (සමතාව), මියුරු (මාධුර්‍යය), සුකුමර (සුකුමාරතාව), අරුත් පළ (අර්ථ-ව්‍යක්තිය), උළාර (උදරත්වය), ඔද (ඕජස), දනකල් (ජන කාන්තිය), සමාදි (සමාධිය) යනු යි. ඉන් මට සිලුටු, සමබැව්, සුකුමර (ශ්ලේෂ–සමතා—සුකුමාරතා—) යන තුන හැර ඉතිරි සත් ගුණය සිංහලයෙහි යෙදෙන බව ගත් කතු වරයා ප්‍රකාශ කරයි.

මට සිලුටු (ශ්ලේෂය), සම බැව් (සමතාව) සුකුමර (සුකුමාරතාව) යන තුන් ගුණය සිංහලයෙහි නො යෙදෙතැ යි කියා අත් හරින ලද්දේ කවර හෙයින් ද යනු පැහැදිලි නො වෙයි. පදයන්ගේ ශ්ලේෂාර්ථයත් සමතාවත් සුකුමාරතාවත් පැරණි සිංහලයට ආවේණික වූ ලක්ෂණයක් වන හෙයින්ද ? සිංහල වචන මාලාව—විශේෂයෙන් පද්‍ය-යෙහි යෙදෙන වචන මාලාව—ස්වභාවයෙන්ම එකී ගුණයන්ගෙන් යුක්ත වූ හෙයින්ද ?

" හැම අලංකාරයක් ම අර්ථයෙහි ඒකාන්තයෙන් රසය වහනය කෙරේ වා. එහෙත් ඒ හැම තන්හි දී ම අග්‍රාම්‍යත්වයෙන් යුක්ත විය යුතු යි." කාව්‍යයෙක අලංකාරයෝ කෙ බඳු තැනක් උසුලත් ද යනු ඔහු මැනැවින් දත් බව මින් පෙනේ. අලංකාරයෝ කාව්‍යය හොබවන්නෝ ය. එහෙත් වැඩි සැරසිල්ලෙන් රූපයක් අශෝභන වන්නා සේ වැඩි අලංකාරයෙන් කාව්‍යයක් ද අශෝභන වන්නේ ය. අලංකාරයන් අතිබහුල ව යෙදුණ තැන ග්‍රාම්‍යත්ව දෝෂයට මඟ පැදෙයි. නියම කවියා විසින් ග්‍රාම්‍යත්ව දෝ-ෂයෙන් සදහට ම වැලැකිය යුතු යි. කාව්‍යයක් අලංකාරයන් ගෙන් සරසන ලදදේ වී නමුත් එය කියවා රස විඳින රසිකයන් ගේ සිත් නොරිදෙන ලෙස ඒ යෙදිය යුත්තේ ය. එය ශිෂ්ට සම්ප්‍රදයයට අනුකූල විය යුතු යි.

සිය බස් ලකර කතුවරයා ගේ විස්තරය කියැවීමෙන් පෙනෙන්නේ ඔහු උසස් කවියා ලෙස සලකනු ලැබුයේ රාජ සභා කවියා වන බව යි. දණ්ඩි මෙන් ම ඔහු ද මහා කාව්‍ය ලක්ෂණ ගෙන හැර දක්වා ඇත්තේ රාජ සභාවට යෝග්‍ය වන පරිදි යි. කථානායකය උදර චරිතයක් ඇත්තා වූ, සතුරන් ජය ගන්නා වූ රණකාමී වීර පුරුෂයෙකි. ඔහුගේ එඩිතර ක්‍රියා කලාපය සතුරන් ඉදිරියෙහි ඔහු දක්වන ක්‍රියා ශූරත්වය උත්කර්ෂයෙන් වර්ණනා කටයුතු යි. එ බඳු වර්ණනා උචිත වනුයේ රාජ සභාවට යි. එහෙයින් ඔහු උසස්කොට සැලැකූ කවියා රාජ සභා කවියා යි, උසස් කොට සැලැකූ කාව්‍යය රාජ සභා කාව්‍යය යි.

ශබ්දර්ථෞ සහිතෞ" යි භාමහ කී තැන ශබ්දයෙන් තොර අර්ථයක් හෝ අර්ථයෙන් තොර වූ ශබ්දයක් හෝ නැත. කාව්‍ය වස්තුවට ඒ ශබ්ද අර්ථ දෙක අවශ්‍ය යි. ඒ කාව්‍යය ශරීරය අලංකාරයන්ගෙන් හොබවනු ලැබේ. ඒ අලංකාරයන් විස්තර කිරීම යි භාමහ ගේ කෘතියෙන් කරන ලදදේ. කාව්‍ය ශරීරය සම්පූර්ණ වීමට තව ද අංග වුවමනා බව සිය බස් ලකර කතුවරයා පෙන්නා දෙයි. එය මහා කාව්‍ය ලක්ෂණයෙන් යුක්ත විය යුතු යි. ඒ ලක්ෂණ කාව්‍යාදර්ශයෙහි දැක්වූ පරිදි මෙම ග්‍රන්ථයෙහි ද දක්වනු ලැබේ ; ඒ කාව්‍ය ලක්ෂණයන් ගෙන් යුක්ත වන අතර ම සත් ගුණයකින් ද යුක්ත විය යුතු යි. ඒ සත් ගුණය උදාහරණ දක්වමින් විභාග කරනු ලැබුව ද එය කාව්‍යය හොබවන අලංකාර

ලෙස කතුවරයා සැලැකූ බව පෙනේ.[17] අලංකාරයන් දෙ කොටසකට බෙදෙන බව ප්‍රකාශ කොට ඇතත් සිය බස් ලකරයෙහි දෙ වැනි සඟියෙන් දක්වෙන 35 අලංකාරය අර්ථාලංකාර ගණයෙහි ම වැටේ. එහෙත් ශබ්දාලංකා ර නමින් ශබ්දය සම්බන්ධ වූ අලංකාර විශේෂයක් ද වෙයි. කාව්‍ය ගුණ වශයෙන් දක්වනුයේ ඒ ශබ්දාලංකාර යි නිගමනය කළ හැකි.

සඟබන්ධ මහා කාව්‍යයේ ලක්ෂණ විස්තර කරන සිය බස් ලකර කතුවරයා කාව්‍ය වස්තුවට යෝග්‍ය වූ වෘත්තාන්ත ද රට සරි ලන වර්ණනා ක්‍රමය ද පැහැදිලි කරයි. කාව්‍යාදර්ශය අනුසාරයෙන් කරන ලද එම විස්තරය අප අලංකාර ග්‍රන්ථයෙහි දක්වෙන්නේ මෙසේ ය :—

“ සග සියෝ මහකව— කිමෙහි ලකුණ වියත් වත්
වත් නිදෙය ආසි හෝ— නමකර හෝ පෙරට වේ.

හෙ වී මෙ සේ යන— පුවතෙයිනත් පුවත් හෝ
සිවු වග පල සබඳ ව—උළාර නා සියෝ වේ

නුවර සයුරු ගිරි සු—සිසි හිරු උද වැන්මෙන්
උයන් දල කිඩුනි මහත්—අවන් මිනදෙළ කෙළියෙන්

පෙළැඹුම් විවා ගැනුම්— කුමරුනු පැන් වැඩුමෙන්
මතුරු දූ දු ගමන් යුද—උළාර නා උදෙනි දු

17. Raghavan V—*Bhoja's Śṛngāra Prakāśa* (Bombay) Vol. I Part II. 300—301.

මට සිලුටු—සමබැව්— සුකුමර (ශ්ලේෂ—සමතා—සුකුමාරතා) යන තුන් ගුණය සිය බසෙහි වෙසෙයින් සැලැකිය යුතු ගුණයන් මෙන් නොයෙදෙන්නේ කවර හෙයින් ද යනු වටහා ගත හැකි ය. ශ්ලේෂ ගුණය නම් අල්ප ප්‍රාණාක්ෂර අධික කොට ඇති සිලුටු බව යි. සිය බසෙහි නොහොත් එ වකට භාවිත වූ පද්‍යමය හෙළ බසෙහි මහා ප්‍රාණාක්ෂර නො යෙදුණ හෙයින් අල්ප ප්‍රාණාක්ෂර යෙදීම ම රීතිය වී. එ බැවින් සිලුටු ගුණය සාමාන්‍ය ලක්ෂණය වූයේ ය. සිය බසෙහි නිරන්තරයෙන් ම පිහිටි ගුණයක් වූ හෙයින් එය විශේෂ ගුණයක් ලෙස දක්වීම බැහැර කරන ලදි.

සම බැව් නම් වර්ණයන්ගේ යෙදීමෙහි යම් පිළිවෙළක් ආරම්භ කරන ලද ද ඒ පිළිවෙළ නොසිඳ ගෙන යැම යි. සංස්කෘත-මාගධී භාෂාවන්හි මෘදු-ස්ඵුට දෙ වර්ගයෙහි ම ශබ්දයන් යෙදෙන නිසා සමතා ගුණය පැහැදිලි ව දක්විය හැකි වෙයි. එහෙත් මෘදු ශබ්ද සමූහයකින් ම යුක්ත වූ හෙළයෙහි ඒ බඳු විශේෂ ගුණයකට අවකාශ නො යෙදේ.

සුකුමර ගුණය පිළිබඳ ව ද මෙය ම කිව හැකි ය. එය හෙළ බසෙහි ඇත්තා වූ ශබ්ද සමුදයයෙහි නිරන්තරයෙන් ම යෙදෙන ගුණයකි. එ බැවින් එය විශේෂ ගුණයක් ලෙස දක්වීම අනවශ්‍ය ය.

මේ තුන් ගුණය පැරැණි සිංහල භාෂාවෙහි ප්‍රකට ව පැවැති ලක්ෂණයන් ලෙස සැලැකිය හැකි ය. සිය බස් ලකර විස්තර වර්ණනාව—හේන්පිටගෙදර ඤාණතිලක සහ හේන්පිටගෙදර ඤාණසීහ. 20-23 පිටු බලන්න.

අලංකාරයන් දෙ කොටසක් ඇති බව සුබෝධාලංකාරයෙහි දක්වෙයි.

“ ව් ප්‍රකාර අලඞ්කාරා—තත්‍ර සද්දත්‍ථ භෙදතො
සද්දත්‍ථා බන්ධනාමාව—තං සජ්ජිත තදවලි.”

සුබොධාලංකාරය—උඩම්මිට ධම්මරක්ඛිත තිස්ස සංස්කරණය. (රන්දෙණේ, 1910). 13 ගාථාව.





ලකුළු කව් රස බැව්—නතුරු නුමුත් නො විතර
සගින් යුත් සවන් ගත්—සුසඳ පිළි නොද මඳ වූ

ලෝ මන රඳනෙ කිව්—කරු දනන් පලදිනේ
තහවුරු ව සිටිනෙ දෙනේ—විසිතුරු ලකර ළ ගනි.” [18]

යට දක්වූ පාඨය කාව්‍යාදර්ශයේ පදගත අනුවාදයක් හා සමාන යි. මහා කාව්‍යයක තිබිය යුතු හැම අවශ්‍ය අංගයක් ම එහි දක්වෙයි. සුළු වෙනසකට ඇත්තේ කථා නායකයා පිළිබඳ වත් සඟිාන්තයේ වෘත්තය පිළිබඳ ව දක්වා ඇති කරුණු ය. කථා නායකයා චතුර උදර දෙගුණයෙන් ම යුක්ත විය යුතු බව කාව්‍යාදර්ශයෙහි පෙනේ (චතුරෝදාත්ත නායකම්. කා. 15). සිය බස් ලකරෙහි නායකයාගේ චතුර බවක් සඳහන් නො වේ. ඔහු උදර චරිතයෙන් යුක්ත විය යුතු ය. පසු ව ද කියැවෙන්නේ ඔහු කෙරෙහි තිබිය යුතු උදර ගුණය ම ය. (“ උළාර නා සියෝ වේ.” “ උළාර නා උදෙනි දු ”[19] තව ද සඟිාන්තයෙහි දී වෘත්තය වෙනස් කළ යුතු බව අප ග්‍රන්ථයේ නො කියැවේ.

කාව්‍ය රචනයෙහි කිවියා විසින් අනුගමනය කට යුතු යහපත් වර්ණනා ක්‍රම ඇත. එය වර්ණනා මාර්ගය නොහොත් රීතිය යි. කාව්‍යාදර්ශයෙහි වෛදර්භ,-ගෞඩීය යන වශයෙන් ප්‍රධාන මාර්ග දෙකක් දක්වෙයි. එම ග්‍රන්ථයෙහි විස්තර කරන ලද දශ ගුණයෙන් යුක්ත වූ නිදොස් වර්ණනා ක්‍රමය වෛදර්භ මාර්ගය යි. සිය බස් ලකරෙහි ද විස්තර කරන ලදුයේ එ කී දශවිධ කාව්‍ය ගුණයෙන් යතකි. ඒ අනුව සලකත හොත් සිය බස් ලකර කතුවරයා පිළිගත් මාර්ගය වෛදර්භ මාර්ගය යි සිතීමට ඉඩ තිබේ. නමින් කිසිවක් ඒ තුමා සඳහන් නො කරයි. සමහර විට සංස්කෘත කාව්‍යයෙහි යෙදුණ ඒ වර්ණනා මාර්ග දෙකින් සිය බසට, සිංහල කාව්‍ය ව්‍යවහාරයට වැඩක් නො වූ හ යි ඔහු සිතුවා විය හැකි. කවර කරුණක් නිසා හෝ වේවා එසේ කරන ලද ද කාව්‍ය නායකයා ගුණවත් භාවයෙන් දක්වා ඔහු සතුරන් ජයගත් හැටි විස්තර කිරීම ස්වභාවයෙන් ම යහපත් මාර්ගය යි සිය බස් ලකරෙහි[20] කියැවෙයි. ඒ හැර වර්ණනා මාර්ග ගැන ඔහු කියා ඇත්තේ එහි විවිධාකාරය යි. “ සකුරු, කිරි, මී පැණි, උක් ආදීන් ගේ එකිනෙකට විශේෂ වූ රස ඇත්තා සේ ම, කියා නිම කොට නො හැකි සේ වර්ණනා මාර්ග ද විවිධ වේ, ඒ අනෙක ප්‍රකාර වූ කාව්‍ය වර්ණනා මාර්ග විස්තර කොට කියා නිම කළ නො හැක්කේ ය. රීතිය පිළිබඳ සිය බස් ලකර කතුවරයා දක්වන අදහස් මේ සේ ය.

පුරාණ කාව්‍ය ශාස්ත්‍ර සිද්ධාන්තයනට අනුකූල ව ස්වකීය කාව්‍යයන් රචනය කළ සිංහල කවීහු කාව්‍ය වස්තුව වශයෙන් සදෘශයක් ම තෝරා ගත්තාහු ය. එහෙත් සිය බස් ලකරෙහි “ පෙදෙන් බුදු සිරිතැ. . . ” ආදි වශයෙන් කියා ඇතත් ඔවුන් තෝරා ගත්තේ බුදු සිරිත නොව බෝසත් සිරිත යි. උදර ගුණයෙන් යුක්ත වූ යහපත් චරිතයක් ඔවුන් සොයා ගත්තේ සිංහල සාහිත්‍යය නිරන්තරයෙන් පෝෂණය ලැබූ ජාතක කථා සම්භාරයෙනි. එහෙත් මෙ තැන දී නැඟිය යුතු ප්‍රශ්නයක් වෙයි. බුද්ධ චරිතය ගද්‍යයට උචිත වූ වස්තුවක් වී නම් පද්‍යයට එය යෙදීමට සිංහල ගත් කරුවන් මැළි වූයේ කවර හෙයින් ද ? අමා වතුර ගැදි කවකි, එහි කතෘහු ගේ ම පිළිගැනීමේ හැටියට එය බුද්ධ චරිතයකි. එහෙත් ඊට සම කළ හැකි පැදි කවක් සිංහලයෙහි නැත. බුද්ධ චරිතය කාව්‍ය වස්තුවට විශාල වැඩි වූයේ ද ? එය කවි සමයත් කවි ශක්තියත් ඉක්මවා යන තරම් වූ හ යි ඔවුහු සිතුවාහු ද ? නො එසේ නම් රඝුවංශයෙහි මහා කවි කාලිදාසයන් සූර්ය වංශයත් ස්වකීය අල්ප විෂය වූ බුද්ධියත් අතර කොතරම් මහත් පරතරයක්, ප්‍රමාණයෙන් කො තරම් වෙනසක් වී ද යි සැලැකූ පරිද්දෙන් ම අප කවීන් ද බුඬ චරිතයත් ස්වකීය අල්ප

18. සි.බ.ල. 21—26.
19. සි.බ.ල. 22—24,
20. සි.බ.ල. 29.

විෂය වූ බුඩියන් අතර විශාල වෙනසක් වූ බව සලකා බුඬ චරිතය වර්ණනා කිරීම වෙනුවට බෝධි සත්ත්ව චරිතය තෝරා ගන්නා විය හැකි ය. බුදුන් වහන්සේ ගේ ගුණාතිශය වනා නිමැවිය නොහැක්කක් බව අප කවිහු මැනැවින් දත් හ. සසදා වතෙහි[21] මෙවැනි ගී වලින් දක්වෙන පරිදි :—

" මුනිඳු ගුණ මහරු—වැකුව ද ම කුදු තෙපලේ
උතුම් ම නො එ මුනි දම්—ලියුව ද නොරන් පත්හි,

නොසෙ කිසි දැ අඳ—බිරු පිළු දුබුල් බිළිදෙක්
ගැඹුරු සයුරු තරනට—තම බඳ තමෙ කි ම'න් මට

ඉති දු මිණි මලෙ වී—දක්මට මුනි ගුණෙක් දෙස්
මොකැසිරැ බඳ මත මා—යුහු කෙළෙ සෙබෙ සේ කිවි."

බුදු ගුණ මහරු වන බැවින් ද රන් රනින් නොකළ පතෙක බුදු දහම නො ලිවුවත් එය උතුම් ම වන බැවින් ද තමා කරන්නට සැරසෙන කටයුත්ත ජාත්‍යන්ධ වූ, බිහිරි වූ කොන්ද පණ නැති දුබුල් බිලිඳකු ගැඹුරු සයුරින් එ තෙර වන්නට කරන තැතක් බඳු වුව ද තම සිත මොක් සැපත පතන හෙයින් ඒ මුනිඳු ගුණයෙන් එක් දේශයක් පමණක් ජෙක කවීන් ගේ සභාව ඉදිරියේ පවසන්නට අප කවියා සැරසේ. බුදු ගුණ හමුවේ තම ශක්තිය මෙ තරම් අල්ප සේ කිව්යාට වැටහුණේ නම් මුළු බුද්ධ චරිතය ම ගැන කවර කථා ද ? මුව දෙව් ද[22] කරු ද

" හහිමි මා මෙනෙන්—ගුණ හිමියා කියන්නට
පොහොම් නෙළුබැසින'වුණ—පලඳුත් හොත් තුසර හර

ඉති දු හොත කියම්—ගුණ ලොබිනි ලෝ හිමියා
මෙනෙහි වරද නොබජවූ—ගුණෙකැත් නම් මෙහි බජවූ " යි

අභිමානයෙන් බුදු හිමියන් ගේ ගුණ වනනුවට වඩා පිනි බිඳු නෙළුම් ඇසින් අවුණා මාලයක් කොට පැලැඳීම පහසු ය යි කීයේ ය. එහෙත් ලෝක ස්වාමියාගේ ගුණ ලෝභයෙන් එය පවසන්නට යන බව සඳහන් කරයි. බුදුන් ගේ ගුණ මහිමය එ තරම් විශාල වූ හෙයින් ඉන් එක් දේශයක් පමණක් වර්ණනා කිරීමෙන් පුරාණ සිංහල බෞද්ධ කවිහු තෘප්තිමත් වූවෝ ය. බුඬ චරිතය වෙනුවට බෝධිසත්ත්ව චරිතය ඔවුන් තෝරා ගත්තේ එ හෙයිනැ යි සිතිය හැකියි. බුදුන් වහන්සේ කෙරෙහි අවංක, ශ්‍රද්ධා භක්තියෙන් යුක්ත වූ ඒ පැරණි කිව්වරයන් මේ මහ ගැනීම පුදුමයක් නො වේ. ඔවුන් ගේ කාව්‍ය රසය විඳීමට උත්සුක වූ ශ්‍රෝතෘ ජනයා ද ඒ කාව්‍යයන් ඇසීමට බලාපොරොත්තු වූයේ ඊට නොඅඩු වූ ශ්‍රද්ධා-භක්තියකිනි. කාව්‍ය රසය දීමට වුවමනා වූ කථා රසය අනූන ව සැපයූ නොසිඳෙන උල්පතක් බඳු වී ය ජාතක පොත. ජාතක පොතින් බැහැර වූ අන්‍ය කථා වස්තු අප කවීන් හට නුවුවමනා වූයේ ද ජාතක පොතෙහි විශේෂ බල පැවැත්වීම නිසා ය.

මෙ ම පරීක්ෂණයෙන් පැරණි සිංහල කවි සමය පිළිබඳ වැදගත් නිගමනයකට බැස ගත හැකි වෙයි. එය සකස්වූණේ එකිනෙකට වෙනස් වූ ලක්ෂණ ඇති සාහිත්‍යයන් දෙකකින් පෝෂණය වීමෙනි. එය කෙටියෙන් කියත හොත් මෙ සේ ය :—

1. සංස්කෘත අලංකාර ශාස්ත්‍ර ග්‍රන්ථයක් ඇසුරු කොට ගෙන රචනා කරන ලද සිය බස් ලකරින් සඟිබන්ධ මහා කාව්‍යයේ ලක්ෂණ සිංහල පද්‍යයට ඇතුළු විය. පද්‍ය කාව්‍යයේ ස්වරූපය ඒ අනුව හැඩගැසුණේය. කව් සිළු මිණින් ඇරැඹුණු සිංහල මහා කාව්‍ය සියල්ල ම ඒ මහ ගත්තේ ය.

21. කුමාරණතුංග—සසදා විවරණය (කොළඹ. බු.ව. 2483). 4–6 ගී.

22. කුමාරණතුංග—මුව දෙව් ද විවරණය (කොළඹ. බු.ව. 2482). 4–5 ගී.





2. පද්‍ය කාව්‍ය වස්තුවට බුදු සිරිත යෙදීම යහපතැ යි සිය බස් ලකර කතුවරයා කී ය. (" පෙදෙන් බුදු සිරිතැ. . . "). එහෙත් බුදු සිරිත පද්‍ය කාව්‍යයට තෝරා ගත් බවක් පැරණි සිංහල සාහිත්‍යයෙහි නො පෙනේ. එය කවි ශක්තිය ඉක්මවා ගිය විෂයයකැ යි සිංහල බෞඬ කවීන් සිතූ සේ ය. කව් සිළු මිණ කරු කිවි බව නමැති වෘක්ෂයෙහි උසස්තම ඵලය ලෙස සැලැකුවේ බෝසත් සිරිත වැනුම යි. කථා නායක වශයෙන් සිංහල කවීන් විසින් තෝරා ගන්නා ලද්දේ බෝසත් සිරිත යි. එය සිංහල මහා කාව්‍ය පද්ධතියේ නිරන්තරයෙන් ම පෙනෙන ලකුණකි. කථා වස්තුව තෝරා ගන්නා ලද්දේ බෞද්ධ ජාතක කථා සමූහයෙනි.

එහෙයින් සිංහල පද්‍ය කාව්‍යයේ ස්වරූපය සහ වර්ණනා ක්‍රමය ඇති වූයේ සංස්කෘත අලංකාර සාස්ත්‍රය අනුව ලියැවුණු සිය බස් ලකරිනි. එහෙත් එහි වස්තුව ජාතක කථා වලින් ගන්නක් විය. කථා නායකයා බෝසත් තුමා විය. පැරණි සිංහල කවි සමය වනාහි සංස්කෘත අලංකාර ශාස්ත්‍ර නියමය අනුව රචිත සිය බස් ලකරින් ස්වරූපය හා වර්ණනා ක්‍රමය ලැබූ, ජාතක කථාවලින් වස්තුව ලැබූ, කව් සිළු මිණි ප්‍රතිපත්තිය අනුව හැඩ ගැසුණු කාව්‍ය මාර්ගය යි. මෙ කී කාව්‍ය නියමයන් අනුව ලියන ලද්ද වූ ද මෙ බඳු ලක්ෂණයන් ගෙන් හා ස්වරූපයෙන් උපලක්ෂිත වූ ද මෙ බඳු වස්තුවකින් යුක්ත වූ ද ඒ පැරණි කවි සමය පණ ලැබුයේ කුමකින් ද ?

( මතු සම්බන්ධ යි )

**ආනන්ද කුලසූරිය**